## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2015

-----------------------------------------------------------

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ සහ අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) රජය විසින් අධිකාරිය වෙත ප්‍රදානය කර තිබූ තක්සේරු වටිනාකම රු. 46,000,000 ක් වූ ඉඩම රජයේ ප්‍රදාන ගිණුමට බැර කළ යුතු වුවත් එම වටිනාකමින් රු. 23 ,950,008 ක් පමණක් එම ගිණුමට බැර කර ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට රු.22,049,992 ක් බැර කර තිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් අධිකාරිය වෙත පවරා දෙන ලද මෝටර් රථ දෙකකට අදාල ආනයන බදු රු.282,448 ක මුදල පමණක් මෝටර් රථ ගිණුමට හර කර තිබුණි.

(ඇ) අධිකාරිය විසින් 2012 වර්ෂයේදී පවත්වන ලද සියවස් සැමරුම වෙනුවෙන්, එම සැමරුමට සම්බන්ධ වූ ආයතන දෙකකින් ලැබිය යුතු රු. 4,906,741 ක මුදල ගිණුම් ගත කර නොතිබුණි.

2.2.2 **ලැබිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.65,340,654 ක් විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මින් රු. 21,676,129 ක් බදු ගෙවීමේදී අඩු කර ගැනීමට එකඟතාවය පල කර තිබූ අතර ඉතිරි රු. 43,664,525 ක ලැබිය යුතු එකතු කළ අගය මත බදු පිළිබඳව ආපසු ලබා දෙන බවට එකඟ වී නොතිබුණි. මේ හේතුවෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිත විය.

2.3 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනත<br>(i) 9 වන වගන්තිය | දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගගන යාත්‍රාංගන සහ තුන්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගගන නාවික පහසුකම් සහ ඒ ගගන යාත්‍රාංගන වලට ආබද්ධ ඉඩම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අධිකාරිය වෙත පවරා සතුකර දෙනු ලැබිය |

| | |
|---|---|
| | හැකි වුවත්, එසේ පවරා සතුකර දිය යුතුව තිබූ උපලේඛනයේ දැක්වෙන විෂයයන් හඳුනාගෙන පවරා දීමට 2015 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ii) 12 (1) සහ (2) වගන්ති | අධිකාරියේ ආදායම් වෙනුවෙන් අරමුදලක් පිහිටුවා ආයතනය උත්පාදනය කරනු ලබන ආදායම් එම අරමුදලට බැර කළ යුතු බව දක්වා තිබූ නමුත් අධිකාරිය ස්වකීය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වෙනම ආදායම් ශීර්ෂ හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා කාර්යසාධන වාර්තා මෙහෙයුම් ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන හා වයස් විශ්ලේෂණ වාර්තා ආදිය මාසිකව ඉදිරිපත් කළයුතු වුවත් එම අවශ්‍යතාවය අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 7.4.5 වගන්තිය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදුකළ යුතු වුවත් 2015 වර්ෂය තුළ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එවැනි භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 1646 | අධිකාරියේ වාහන සංචිතයට අදාලව මාසික සාරාංශ මුල් පිටපත් සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපතිවරයා වෙත මාසිකව ලබාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.12 මාර්ගෝපදේශය | මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ ත්‍රෛමාසික වාර්තා විගණකාධිපති වෙත පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.871,287,793 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.812,077,415 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිඵලය රු.59,210,378 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙහෙයුම් වියදම රු.15,103,518 කින් හා බදු වියදම රු.31,829,662 කින් වැඩි වී තිබුණද මෙහෙයුම් ආදායම රු.106,143,558 කින් වර්ධනය වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමිකය, රාජ්‍ය බදු හා ජංගම

නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයේ රු.561,100,000 ක්වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.1,415,400,000 දක්වා වැඩි වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

4.1 **කාර්යසාධනය**

---------------

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුව නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කලින් නියම කළ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම හෝ ඒවා අභිබවා යෑම, යෝග්‍ය පරිදි සම්පත් සපයාගැනීම,වෘත්තීයභාවයට හා නිපුණත්වයට පත්වීම, පුළුල් විශ්වසනීයත්වයක් සහ පිළිගැනීමක් ලබා ගැනීම, අධිකාරියේ කාර්යසාධනය තිරසාර ලෙස පවත්වාගැනීම හා වැඩිදියුණු කිරීම, සෑම ක්‍රියාවක්ම ඉහළම මට්ටමේ ඵලදායීතාවයකින් යුක්තව ඉටු කිරීම, අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේෂිත පරිචයන් සඳහා ඉහළම අනුකූලතාවක් දැක්වීම හා සිවිල් ගුවන් සේවා කටයුතු සැලසුම්කරණය හා සංවිධානය කිරීම සඳහා ශක්තිමත් පහසුකම් සපයන්නෙකු වීම යනාදිය ආයතනයේ අරමුණු විය.

කාර්යසාධනයට අදාළව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධන වාර්තා අනුව අධිකාරියේ ගුවන්යානා වලන 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 20 ක ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණු අතර සිවිල් ගුවන් සේවා නියාමනයට අදාල පරීක්ෂණ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) නිකුත් කරන රාජ්‍ය නිරුපද්‍රිත සංක්ෂිප්ත වාර්තාව අනුව, 2015 වර්ෂයේ දී රටවල් 191 අතුරින් ශ්‍රී ලංකාව 19 වන ස්ථානයට පත් වී තිබුණි. කෙසේ වෙතත් , මෙම වාර්තාවේ අන්තර්ගත සංරචක 8 අතුරින් කාර්යසාධන පදනම් කරගත් සංතරණ (Performance Based Navigation (NPN) ) සංරචකය රතු ලකුණින් (Red Mark) යුක්ත විය. කාර්යසාධනය පදනම් කරගත් සත්‍යාපන පද්ධතිය (Performance Based Verification System) මෙහෙයවීම සඳහා පුහුණු කරනු ලැබූ නිලධාරියා සේවයහැර යාම සහ ගුවන් තොටුපල සහ ගුවන් සේවා සමාගම කාර්යසාධන පදනම් කරගත් ගුවන් සංතරණ පද්ධතිය සකස් කිරීම ප්‍රමාදවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) අධිකාරියේ සියළු මෙහෙයුම් කාර්යයන් ආවරණය වන පරිදි අංග 18 ක් හඳුනාගෙන ඊට අනුරූපී ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key performance Indicators ) හඳුන්වා දී තිබූ නමුත් ඊට අනුකූල වන ආකාරයට කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ආ) අංක 420 හා 2011 පෙබරවාරි 10 දිනැති ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුමෙහි 20 වෙනි වගන්තිය අනුව මුල් ගිවිසුම අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් වලංගු වන බව දක්වා තිබුණි. බදුකරු නැවත වසර දෙකක කාලයක් සඳහා ගිවිසුම දීර්ඝ කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ගිවිසුම අළුත් කළයුතු බව දක්වා තිබූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විටත් අදාල ගිවිසුම අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

පිරිවැය රු.43,563,226 ක් නිම කරන ලද අධිකාරියට අයත් වීරවිල සංචාරක බංගලාව සඳහා ආයතනය විසින් සංචාරක නිවාස භාරකරුවෙකු බඳවා ගැනීමකින් තොරව පෞද්ගලික ආයතනයකට

පවරා දී තිබූ තිබීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු.2,250,000 ක කළමනාකරණ හා නඩත්තු කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි.

**4.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2015 අප්‍රේල් 09 වන දිනැති අංක ඕඑම්එස්/1748 දරන මුදල් අමාත්‍යාංශ ලිපිය පරිදි අධ්‍යක්ෂක - ගුවන් සංතරණ සේවා හා අධ්‍යක්ෂක - ගගන යාත්‍රාංගන (AERODROMES) තනතුරු සඳහා පිළිවෙලින් රු.235,000 ක් සහ රු.225,000 ක විශේෂ දීමනාවක් ලබා ගැනීම සඳහා වාණිජ ගුවන් නියමු (Commercial Pilot) බලපත්‍රයක් තිබිය යුතු වුවත් එයට පටහැනිව ගුවන් ගමන් පාලක (Air Traffic Controller) බලපත්‍රලාභී නිළධාරීන්ට රු. 2,300,000 ක විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණි.

4.5 **නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

මත්තල ගුවන් තොටුපල තුළ රු.45,043,723 ක් වැයකර ඉදිකරන ලද වර්ග අඩි 1,200 ක් වූ ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවති අතර එහි සේවය සඳහා නිලධාරීන් දෙදෙනෙකු පමණක් යොදවා තිබුණි.

**මත්තල ගුවන් තොටුපල ක්‍රියාත්මක වූයේ නම් අවශ්‍ය සේවය ලබාදීමට ප්‍රමාණවත් පරිදි මෙම කාර්යාල පහසුකම ඉදිකරනු ලැබූ අතර ගුවන් තොටුපල අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය ඌන උපයෝජිත තත්ත්වයට පත් වී තිබූ බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.**

4.6 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්**

අධිකාරිය සතු රු.324,000 ක් වටිනා මුද්‍රණ යන්ත්‍ර 3ක් හා පරිඝනක යන්ත්‍ර 3ක් රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි.

4.7 **කාර්ය මණ්ඩල පරිපාලනය**

අධිකාරියේ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ නිලධාරී 10 ක් ද විධායක මට්ටමේ නිළධාරී 13 ක් ඇතුළුව පුරප්පාඩු 23 ක් පැවතුණි. අධිකාරිය උසස්වීම් ලබාදීම මගින් හෝ නව බඳවා ගැනීම් මගින් ඉහත පුරප්පාඩු පුරවනු වෙනුවට කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් 12 දෙනෙකු බඳවාගෙන 2015 වර්ෂය සඳහා එකතුව රු.21,168,508 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගෙන පුහුණු කිරීම් මගින් පළපුරුදු නිලධාරීන් බිහි කිරීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබූ අතර මෙම තත්ත්වය අධිකාරියේ ඉදිරි පැවැත්මට අහිතකර ලෙස බලපාන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | සේවක මණ්ඩල කළමනාකරණය | ස්ථිර පදනම වෙනුවට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) | ස්ථාවර වත්කම් | වාර්ෂික භෞතික සත්‍යාපනය සිදු නොකිරීම හා වත්කම්වල සාධාරණ අගය වාර්තා නොකිරීම. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | ස්ථිර අභ්‍යන්තර සහායක විගණන කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන නොයාම. |
| (ඈ) | කාර්යසාධනය | ප්‍රධාන කාර්යසාධන දර්ශක අනුව වාර්තා පිළියෙල නොකිරීම. |